# සුදු කොඩි නඩුවේ දේශපාලනය සහ නීතියට පටහැනි තීන්දුව - 2

ශ්‍රීලාල් සෙනෙවිරත්න

5. 'gota ordered them to be shot' යන වචන විත්තිකාර ජෙනරාල්වරයා ඒ ආකාරයෙන්ම ප්‍රකාශ කළ බව හරස් ප්‍රශ්ණවලට පිළිතුරු දෙමින් ෆෙඩ්රිකා මුලින් පිළිගෙන ඇත. එහෙත් ඇය විසින්ම ප්‍රකාශ කර ඇත්තේ විත්තිකරු ප්‍රකාශ කළ වචන තමන් වෙනස් ආකාරයකින් සටහන් කරගත් බවයි. එබැවින් එකී වචන විත්තිකාර ජෙනරාල්ගේ වචන නොවන බව බහුතර විනිසුරු දෙපොළ සිය අවධානයට ලක්කර නැත.

පැමිණිල්ලේ සාක්ෂිකාරිය ෆෙඩ්රිකා ජෑන්ස්ගේ මූලික සාක්ෂිය සහ හරස් ප්‍රශ්ණවලට දුන් පිළිතුරු විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ඇය වරින් වර සිය ස්ථාවරය වෙනස් කරමින් සාක්ෂි දෙන බවය. එබැවින් එය විශ්වසනීයත්වයෙන් තොරය. ඇය නඩුවේ හරයට බලපාන කරුණු පිළිබඳ අසත්‍ය සාක්ෂි දී ඇත. ෆෙඩ්රිකාගේ සාක්ෂිය නියත නොවන :සබප්ජදබිසිඑැබඑ* බව පැහැදිලිවම පෙනී යන බවට විනිසුරු වරාවැව සඳහන් කර ඇතත් බහුතර විනිසුරු දෙපොළ ඒ කරුණ නිසි ඇගයීමකට සහ විශ්ලේෂණයකට ලක්කර නොමැත.

6. ජෙනරාල් ෆොන්සේකා සමග කළ සාකච්ඡාව පටිගත කරනලද බවත්, එකී හඬ පටිය ඇය සතුව තිබෙන බවත් ෆෙඩ්රිකා තමන්ට පැවසූ බව පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු වන තරංග දිනුෂ ජයකොඩි සිය සාක්ෂියේදී කීවේය. එහෙත් ෆෙඩ්රිකා සාක්ෂි දෙමින් කියා සිටියේ ඒ සාකච්ඡාව සඳහා පටිගත කිරීමේ යන්ත්‍රයක් රැගෙන නොගිය බවයි. පැමිණිල්ලේ සාක්ෂි අතර පවතින මේ පරස-'පරය නඩුවේ හරයටම බලපාන නමුත් එය නිසි ලෙස විෂ්ලේෂණය කිරීමට බහුතර විනිසුරු දෙපොළ අසමත්ව ඇත.

ෆෙඩ්රිකා 'රෙකෝඩ් කිරීම' යන වචනය සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් කර නොමැත. එහෙත් පැමිණිල්ලේ 12 වන සාක්ෂිකරු ඒ වචනය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර ඇත. එහෙත් ෆෙඩ්රිකා නැවත කැඳවා 'රෙකෝඩ් කිරීම' යන කරුණ ගැන පැහැදිලි කරගැනීමට පැමිනිල්ල ක්‍රියා කළේ නැත. නඩුවේ හරයට බලපාන මේ කරුණ සම්බන්ධයෙන්ද බහුතර විනිසුරු දෙපොළේ නිසි අවධානය යොමුව නැත. එය තහවුරු කෙරෙන වෙනත් සාක්ෂියක්ද පැමිනිල්ල විසින් අධිකරණයට ඉදිරිපත් කර නැත. එසේ තිබියදී 'ෆෙඩ්රිකා බර්ගර් ජාතික කාන්තාවක් වන අතර, ඇය මෙහිදී රෙකෝඩ් කළා කියා සිංහලෙන් පිළිතුරු දීමේදී අදහස් කළේ ලිඛිතව රෙකෝඩ් කළා යන්න බව අනෙකුත් සාක්ෂි සමග සසදන විට පෙනී යයි' ලෙසින් බහුතර විනිසුරු දෙපොළ උපකල්පනීය නිගමනයකට එළැඹී ඇත. එය මුලුමනින්ම නීතියට පටහැනිය.

7. තමන් විසින් ලියන ලද වාර්තාව 2009/05/21 'ඩේලි මිරර්' පුවත්පතේ පළවූ ලිපියකින් උපුටාගෙන තමන් විසින් ප්‍රථම වරට නිර්මාණය කළ ප්‍රවෘත්තියක් බව ෆෙඩ්රිකා හරස් ප්‍රශ්ණවලට පිළිතුරු දීමේදී පිළිගෙන තිබේ. ෆෙඩ්රිකාගේ ප්‍රවෘත්තිය ඊට මාස හතකට පමණ පෙර පළවූ පුවත්පත් ලිපියකින් උපුටාගත් එකක් බව විත්තිය විසින්ද ඔප්පුකරනු ලැබ තිබේ. ඒ මත විත්තිය විසින් මතුකළ කරුණු දෙකක් මනාව විශ්ලේෂණය කළ වරාවැව විනිසුරුවරයා අපරාධ නීති සිද්ධාන්ත අනුව සැකයේ වාසිය විත්තියට ලබාදී ඇත.
එම කරුණු දෙක නම්

(අ). ෆෙඩ්රිකා විසින් ජෙනරල් ෆොන්සේකා ප්‍රකාශ කළ බව පවසමින් පලකළ වාර්තාව නිර්මාණය කරනු ලැබ ඇත්තේ පැරණි පුවත්පත් ලිපියකින් කරුණු උපුටා ගෙනද ?

(ආ). අධි චෝදනාවට පදනම් වන ජෙනරල් ෆොන්සේකා විසින් ෆෙඩ්රිකාට ප්‍රකාශ කරන ලදැයි කියන (ෆෙඩ්රිකාගේ වාර්තාවේ සඳහන් වන වචන) ජෙනරල් ෆෙඩ්රිකාට ප්‍රකාශ කළ සත්‍ය වචනමද? විනිසුරු වරාවැව මේ කරුණු විශ්ලේෂණයෙන් අනතුරුව සැකයේ වාසිය විත්තියට ලබාදී ඇතත්, බහුතර විනිසුරු දෙපොළ විත්තිය ෆෙඩ්රිකාගෙන් විමසූ ප්‍රශ්ණ ඇය විසින් ප්‍රතික්ෂේප කරන ලද බව



පවසමින් ඇයගේ සාක්ෂිය පිළිගෙන ඇත. මෙය නීතියට පටහැනිය.

8. ඇය කිසි විටෙකත් වැරදි කරුණු පළ නොකරන බව සහ ඇය ලියූ කිසිදු කරුණක් වැරදි බව ඔප්පු වී නැති බවත් අධිකරණය හමුවේ පෙන්වීමට ෆෙඩ්රිකා උත්සාහ උත්සාහ දැරුවාය. එහෙත් ඇය පළකළ වාර්තා මගින් අවස්ථා ගණනාවකදී ඇය අධිකරණයට අපහාස කර ඇති බවත්, අධිකරණ නියෝග කඩ කර ඇති බවත්, අධිකරණයෙන් අවවාද ලබා ඇති බවත් හරස් ප්‍රශ්ණවලට උත්තර දෙමින් අධිකරණය හමුවේ ඇය පිළිගත්තාය.

මේ අනුව ෆෙඩ්රිකා වැරදි කරුණු පළකරන තැනැත්තියක් බව විත්තිය අධිකරණය හමුවේ ඔප්පුකර තිබේ. එහෙත් බහුතර විනිසුරු දෙපොළ ඒ කරුණු සම්බන්ධයෙන් කිසිදු නිගමනයකට එළැඹීමකින් තොරව ෆෙඩ්රිකාගේ සාක්ෂිය පිළිගෙන ඇත. එය පිළිගත් අපරාධ සිද්ධාන්තයන්ට මුලුමනින්ම විරුද්ධය.
9. සැළකිය යුතු සම්මුඛ සාකච්ඡාවක් සඳහා යන විට අලුත් සටහන් පොතක් රැගෙන යන බව සිය මූලික සාක්ෂියේදී ෆෙඩ්රිකා ප්‍රකාශ කර ඇත. එහෙත් ජෙනරල් ෆොන්සේකා සමඟ සම්මුඛ සාකච්ඡාව සඳහා එලෙස අලුත් පොතක් රැගෙන නොගිය බව හරස් ප්‍රශ්ණවලට පිළිතුරු දෙමින් ඇය ප්‍රකාශ කර ඇත. එකී කරුණ කෙරෙහි සාක්ෂි නීතියට සහ අපරාධ නීති සිද්ධාන්තයන්ට අනුව අවධානය යොමුකිරීමට බහුතර විනිසුරු දෙපොළ අපොහොසත්ව ඇත.

එසේම ෆෙඩ්රිකා අධිකරණයට ඉදිරිපත් කර ඇති සටහන් පොතේ සෙසු පිටු සහ ජෙනරල් ෆොන්සේකා ප්‍රකාශ කළ බව කියන කරුණු ඇතුළත් පිටු අතර කිසිම වෙනසක් නොමැති බව ෆෙඩ්රිකා සිය සාක්ෂියේදී පවසා ඇත. එහෙත් විනිසුරුවරු පොත පරීක්ෂා කිරීමේදී ජෙනරල් ප්‍රකාශ කළ බව කියන වචන ඇතුළත් පිටුව පොතේ අනෙකුත් පිටුවලට වඩා වර්ණයෙන් සහ ඝණකමෙන් වෙනස් බව බැලූ බැල්මටම හඳුනාගෙන ඇත. ඒ අනුව ෆෙඩ්රිකා සිය සාක්ෂිය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන සටහන් පොත සම්බන්ධයෙන් බලවත් සැකයක් හටගනියි. එහි සැකයේ වාසිය විත්තියට හිමිවිය යුතුය. එහෙත් බහුතර විනිසුරු දෙපොළ මේ පිළිබඳ කිසිදු අවධානයක් යොමු නොකර ෆෙඩ්රිකාගේ සටහන් පොත සාක්ෂියක් ලෙස පිළිගෙන විත්තිකරු වරදකරු කිරීම මුලුමනින්ම නීතියට පටහැනිය.

10. සැළකිය යුතු සම්මුඛ සාකච්ඡාවක් සඳහා යන විට තමන් පටිගත කිරීමේ යන්ත්‍රයක් රැගෙන යන බව හරස් ප්‍රශ්ණවලට පිළිතුරු දෙමින් ෆෙඩ්රිකා ප්‍රකාශ කර ඇත. බහුතර විනිසුරු දෙපොළ සිය තීන්දුවෙහි දක්වා ඇත්තේ ජෙනරල් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවට ෆෙඩ්රිකා පටිගත කිරීමේ යන්ත්‍රයක් රැගෙන නොගිය බව ඇය විසින් ප්‍රකාශ කරන ලද බවය. මේ සම්බන්ධයෙන් මතුවන බරපතල සැකයේ වාසියද විත්තියට හිමිවිය යුතුය. එහෙත් බහුතර විනිසුරු දෙපොළ එම සැකයේ වාසිය විත්තියට ලබාදී නොමැත.

ජෙනරල් ෆොන්සේකා සමඟ සම්මුඛ සාකච්ඡාව පවත්වා ඇත්තේ ෆෙඩ්රිකා නොව රක්මිජ් විජේවර්ධන බවත්, ඒ අවස්ථාවට ෆෙඩ්රිකා සහභාගි වූයේ සාකච්ඡාව අවසානයේ වෙනත් ප්‍රශ්ණයක් ඇසීමට බවත් බහුතර විනිසුරු දෙපොළ පිළිගෙන ඇත. ඒ අනුව ෆෙඩ්රිකා ජෙනරල් ෆොන්සේකා සමඟ පවත්වන ලද්දේ සම්මුඛ සාකච්ඡාවක්ද, නැත්නම් සුහද කතාබහක්ද යන කරුණ සම්බන්ධයෙන් බහුතර විනිසුරු දෙපොළේ අවධානය යොමුවී නැත.

ජෙනරල් ෆොන්සේකාගේ ජනාධිපතිවරණ මෙහෙයුමට සහාය ලබා දීමට තම පුවත්පත් සමාගම තීරණය කරන ලද බවට ෆෙඩ්රිකා සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත. (එය බහුතර විනිසුරු දෙපොළේ තීන්දුවෙහි 10 සහ 11 පිටුවල දක්වා ඇත.) එසේ තිබියදී ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂගේ 'මහින්ද චින්තන' පොත මුද්‍රණය කිරීමටද ලීඩර් පුවත්පත කටයුතු කර ඇත. මේ අනුව ලීඩර් සමාගම ජෙනරල් ෆොන්සේකාට සහයෝගය දෙනු ලැබුවේ සත්භාවයෙන්ද යන කරුණ කෙරෙහි සැකයක් මතුවේ. ඒ සැකයේ වාසිය විත්තියට ලබාදීමටද බහුතර විනිසුරු දෙපොළ අපොහොසත්ව ඇත. තම සමාගම ජෙනරල් ෆොන්සේකාගේ ජනාධිපතිවරණ මෙහෙයුමට සහාය දීමට ලීඩර් පුවත්පත සහාය දීමට තීරණය කිරීම සම්බන්ධයෙන් පුවත්පතේ කතුවරිය වන තමන්ට පැකිළීමක් තිබූ බවට ෆෙඩ්රිකා කළ ප්‍රකාශය සම්බන්ධයෙන්ද බහුතර විනිසුරු දෙපොළ කිසිදු අවධානයක් යොමුකර නැත.

ෆෙඩ්රිකාගේ සාක්ෂියේ විශ්වාසනීයත්වය කෙරෙහි බරපතල සැක මතුකරන කරුණු පහකි.
ෆෙඩ්රිකා,
,පුවත්පත් මණ්ඩලයේ විනිශ්චය සභාවට එරෙහිව කුරුදුවත්ත පොලිසියට අසත්‍ය පැමිණිල්ලක් කිරීම,
,විත්තියේ නීතිඥ මහතාට එරෙහිව සාක්ෂි කූඩුවේ සිට ප්‍රකාශ කළ කරුණු අසත්‍ය ඒවා බව ඔප්පුවීම,
,කර්තෘ සංසද සම්මාන සඳහා ඉදිරිපත් කළ අයදුම්පත්‍රය සම්බන්ධව අසත්‍ය සාක්ෂි ලබාදීම,
,ජෙනරල් සමඟ සම්මුඛ සාකච්ඡාව පැවැති ස්ථානයෙන් රක්මිජ් විජේවර්ධන සහ ඡායාරූප ශිල්පී තුසිත කුමාර ඉවත්ව ගිය බව ෆෙඩ්රිකා සිය සාක්ෂියේදී කීවත් නැවත ඒ දෙදෙනා කැඳවීමට කටයුතු නොකිරීම.

මේ කරුණු ෆෙඩ්රිකාගේ සාක්ෂියේ සත්‍ය අසත්‍යතාවයට බලපාන ආකාරය බහුතර විනිසුරු දෙපොළ විශ්ලේෂණය කර නැත.

11. පැමිනිල්ලේ ප්‍රධාන සාක්ෂිකාරිය වන ෆෙඩ්රිකාගේ සාක්ෂිය පැමිණිල්ල විසින් කැඳවූ වෙනත් සාක්ෂි මගින් තහවරු වී නොමැත. එම කරුණ බහුතර විනිසුරු දෙපොළ නිසි ඇගයීමකට ලක්කර නොමැත.

ජෙනරල් ෆෙඩ්රිකාට කරන ලද බව කියන කරුණු ජෙනරල් විසින් නැවත නැවතත් ප්‍රකාශ කරන ලද බව තහවුරු කිරීමට පැමිණිල්ල ඉදිරිපත් කළ සංයුක්ත තැටි 3 මුල් පටිගත කිරීම් නොව සංස්කරණය කරන ලද පිටපත්ය. ඒ අනුව පැමිණිල්ල සාක්ෂි ආඥා පනත අනුව මෙම සාක්ෂිය අධිකරණය ඉදිරියේ ඔප්පු කරන ලැබුවේද යන්න බහුතර විනිසුරු දෙපොළේ අවධානයට ලක්ව නොමැත.

12. ෆෙඩ්රිකාගේ සාක්ෂිය තහවුරු කිරීම සඳහා ෆෙඩ්රිකා ජෙනරාල්ගෙන් අදාළ කරුණ විමසන අවස්ථාවේ ඇය සමඟ එම ස්ථානයේ සිටි බව කියන ලාල් වික්‍රමතුංග පැමිනිල්ලේ දෙවන සාක්ෂිකරු වශයෙන් සාක්ෂි ලැයිස්තුවට ඇතුළත්කර තිබුණද පැමිණිල්ල ඔහුගේ සාක්ෂි කැඳවීමෙන් වැළකී සිටියේය. මෙයින් පෙනී යන කරුණු කීපයකි.

(අ) ලාල් වික්‍රමතුංග සාක්ෂියට කැදවූයේ නම් ජෙනරල් විසින් ෆෙඩ්රිකාට පවසන ලදැයි ෆෙඩ්රිකා විසින් අධිකරණයට කරන ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව හෙළිවීමෙන් පැමිණිල්ල බිද වැටීම.
(ආ) ෆෙඩ්රිකා අසත්‍ය සාක්ෂි ප්‍රකාශ කරන්නියක බව ලාල් වික්‍රමතුංගගේ සාක්ෂිය මගින් තහවුරුවී-මෙන් පැමිණිල්ලට අවාසිදායකවීම.

(ඇ) අපරාධ නඩු විධාන සංග්‍රහය මගින් අධිකරණයට පැවරී ඇති බලය අනුව ලාල් වික්‍රමතුංග සාක්ෂි සඳහා කැදවීමට අධිකරණයට හැකියාව තිබුණද අධිකරණය ඒ සඳහා පියවර නොගැනීම.

මේ කරුණු පූර්වාදර්ශ නඩු තීන්දු ගෙනහැර දක්-වමින් විත්තිය අධිකරණයේ අවධානයට ලක්කළද බහුතර විනිසුරු දෙපොළ එම පූර්වාදර්ශ ප්‍රතික්ශේප කිරීම පිළිගත් නීතියට පටහැනිය.
13. ෆෙඩ්රිකා හරස් ප්‍රශ්ණවලට පිළිතුරු දීමේදී නඩුවේ හරයට බලපාන කරුණු පිළිබඳ අවස්ථා 20 කදී පමණ එකිනෙකට පරස්පර විරෝධි සාක්ෂි ලබාදී ඇත. තවත් අවස්ථා 100කදී පමණ අසත්‍ය ප්‍රකාශ කර ඇත. එසේ තිබියදී බහුතර විනිසුරු දෙපොළ ෆෙඩ්රිකාගේ සාක්ෂිය පිළිගැනීමට එක් හේතුවක් ලෙස දක්වා ඇත්තේ ඇගේ සාක්ෂියේ පරස්පර විරෝධතාවයක් හෝ ඌනතාවයක් ලකුණු කිරීමට විත්තියට නොහැකිවීමයි.

ෆෙඩ්රිකා සාක්ෂි දෙන අවස්ථාවේදී, ඒ සාක්ෂිය තුළම පරස්පර විරෝධතාවයන් හෝ ඌණතාවයන් ලකුණු කිරීම කළ නොහැකි බව බහුතර විනිසුරු දෙපොළේ අවධානයට ලක්ව නොමැත. එමෙන්ම ෆෙඩ්රිකාගේ සාක්ෂිය සමස්ථයක් ලෙස විශ්ලේෂණය කිරීමටද එම දෙපොළ අසමත්වී ඇත. එබැවින් ජෙනරල් ෆොන්සේකා වරදකරු කරමින් එම දෙපොළ ලබා දුන් තීන්දුව නීතියට පටහැනිය.
14. ෆෙඩ්රිකා නිර්මාණය කළ පුවත්පත් වාර්තාව කිසිදු තහවුරු කිරීමකින් තොරව පළ කර ඇති බව හරස් ප්‍රශ්ණවලට පිළිතුරු දෙමින් ඇය පිළිගෙන ඇත. බහුතර විනිසුරු දෙපොළේ තීන්දුවේ 7 හා 13

30 වන පිටට